UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2009**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

SP (NF/TL) V02970/1
© UCLES 2009

UNIVERSITY *of* CAMBRIDGE International Examinations

**[Turn over**

www.xtremepapers.net

**BLANK PAGE**



www.xtremepapers.net

## Section A – Translation

**1** Translate into **English**:

උසස් විදුහල් ශිෂ්‍යාවගේ සිත උද්දාමයෙන් පිරී තිබුණි. එහෙත් ඇ තැතිගැන්මකින් ද යුතු වූවාය. ඒ ඇය ගුවන් යානයකින් යන පළමු ගමන මෙන්ම විදේශයකට යන පළමු වතාව ද විය. ඇඳුම් බෑගය යතුර දමා හොඳින් වසා තිබේදැයි පරීක්ෂා කර බැලූ ඇ තම ටිකට්පත හා ගමන් බලපත්‍රය ද අත්බෑගය තුළ සුරක්ෂිතව තිබේදැයි නැවතත් පිරික්සුවාය. ඇ පෝළිමට එක්වන විට බිය මුසු සිතින් බලා සිටි දෙමාපියෝ ඇ දෙසට අත් වැනූහ.

කවුන්ටරයේ සිටි නිලධාරියා ඇගේ ටිකට්පත හා ගමන් බලපත්‍රය පෙන්වන ලෙස ඉල්ලා සිටියේය. අත්බෑගයෙන් ගනිද්දී ඒවා ඇගේ අතින් බිම වැටුණි. ඔහු සිනා සී ඒතරම් සංචාරය කොට නැද්දැයි ඇගෙන් ඇසුවේය.

ඇගේ ඇඳුම් බෑගයේ බර කිරා ලේබල් අලවන ලදී. ඉන්පසු එය රැම්ප් එක දිගේ නොපෙනී ගියේය. නිලධාරියා ඇගේ ලියවිලිවල සීල්තබා යානයට ගොඩවීමේ බලපත්‍රයක් ද සමග ආපසු දී ගුවන් තොටුපොළ පර්යන්තයේ ඈත කෙළවරේ වූ පිටවීමේ දොරටුව ඇයට පෙන්වූයේය.

තම ලියකියවිලි තදින් අල්ලා ගත් ගැනු ළමයා සිය දෙමාපියන්ගෙන් සමුගැනීමට ඔවුන් වෙත ආපසු ගියාය. ඔවුන් ඇට සෙමින් සුබ පැතුවාට පසු ඇය ශාලාව මැදින් පිටවීමේ දොරටුව දෙසට ගමන් කළාය. ඇ එයින් පිටතට ගියාය. වහා නොපෙනී ගියාය.

[10]

**2** Translate into **Sinhala**:

The old lady had finished her shopping in the market and was setting off on her way home. She carried her vegetables and the newspaper in her cloth bag, and she had her purse tucked under her arm. She stopped at the traffic lights and waited for them to turn red. The speed of some of the cars on the road frightened her, and she always looked both ways several times before stepping out onto the road.

A young lady hurried past her impatiently knocking her shopping bag as she went. Some onions fell out of her bag onto the road. The old lady bent down and tried to gather them up. She managed to hold two of them but her foot knocked another farther away. As she shuffled after this onion, the traffic lights changed to green and a car, driven by a bald headed man, beeped loudly.

The lady jumped, waving her hands for the car to stop, and dropped her purse. She looked frightened. At that moment two children crossing the road came up to her. One held her hand while the other picked up the missing onion and the purse. They led her to the other side of the road and then put her things back in her bag for her. She thanked them and then continued slowly on her way home.

[20]

© UCLES 2009


www.xtremepapers.net

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer in **Sinhala** the questions that follow.

නෙල්සන් රෝලිහ්ලහ්ලා මැන්ඩෙලා ඉතාමත් ඉහළින් ලෝකයාගේ ගෞරවයට පාත්‍ර වන්නාවූත් අගය කරනු ලබන්නාවූත් දේශපාලන නායකයෙකි. වර්ණභේදවාදයේ බිඳවැටීමෙන් පසු පවත්වන ලද පළමු මැතිවරණයේදී ජයගත් ඔහු දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරාගනු ලැබූ ප්‍රථම ජනාධිපතිවරයා විය. 'ඇපාතයිඩ්' හෙවත් වර්ණභේදය වූකලී විවිධ ජනවර්ගවලට අයත් මිනිසුන්ට විශාල වශයෙන් වෙන් වෙන්ව ජීවත්වීමටත්, වෙන වෙන ප්‍රදේශවල වාසය කරන්නටත් සැලැස්වූ, පාසැල් පවා ජනවර්ග අනුව වෙනම පිහිටුවා තිබුණාවූත් පාලන ක්‍රමයකි. එම පාලන ක්‍රමය දකුණු අප්‍රිකාවේ අවුරුදු පණහක පමණ කාලයක් පැවති අතර සුදුජාතික නොවූවන්ට හිමිවූයේ සීමිත බලයකි. ඔවුන්ගෙන් වැඩි සංඛ්‍යාවකට ඡන්දබලය පවා හිමිනොවීය. සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල ද ඔවුන්ට ලැබුණේ සීමිත පහසුකම්ය.

1918 දි උපන් නෙල්සන් මැන්ඩෙලා වර්ණභේදවාදයට විරුද්ධ ක්‍රියාකාරිකයකු ලෙස ප්‍රසිද්ධ වූ අතර එම ක්‍රමය අවසන් කරලීමේ ව්‍යාපාරයන්හි සාමාජිකයකු ලෙස කටයුතු කළේය. ඔහුගේ දේශපාලන චින්තනයට තදින්ම බලපෑවේ සුප්‍රකට ඉන්දියානු නායකයකු වූ මහාත්මා ගාන්ධිගේ සත්‍යය, සාධාරණත්වය හා අහිංසාව පදනම් කරගත්තාවූ දර්ශනයයි. මහාත්මා ගාන්ධි තුමා කලක් දකුණු අප්‍රිකාවේ ජීවත් වෙමින් එහි වැඩ කර තිබුණේය. විරෝධතා ව්‍යාපාර මෙහෙය වූ මැන්ඩෙලාට බොහෝ විට සැඟවී සිටින්නට ද සිදුවිය. එම විරෝධතා ව්‍යාපාර අවසානයේ මැන්ඩෙලාට සුප්‍රසිද්ධ රයිවෝනියා නඩුවට මුහුණ දෙන්නට සිදුවූ අතර තමාගේ ක්‍රියා මාර්ගය සාධාරණීකරණය කරමින්, නීතිඥයකු වශයෙන් ලබා තිබූ අත්දැකීම් ද ප්‍රයෝජනයට ගනිමින් ඔහු එම නඩු විභාගයේදී ඉතා ප්‍රසිද්ධ කථාවක් පැවැත්වූයේය. මැන්ඩෙලා එම කථාව අවසන් කළේ මතු දැක්වෙන වචන වලිනිඃ

"මගේ ජීවිත කාලය තුළ මා මගේ මුලු කාලයම කැප කළේ අප්‍රිකානු ජනතාවගේ අරගලය වෙනුවෙනි. මම සුදු ජාතිකයින්ගේ ආධිපත්‍යයට විරුද්ධව සටන් කළෙමි. එසේම මම කලු ජාතිකයින්ගේ ආධිපත්‍යයට එරෙහිව ද සටන් කළෙමි. සියලුම මිනිසුන් සාමකාමීව සමාන අයිතිවාසිකම් භුක්තිවිඳිමින් ජීවත්වන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් උදාකරගැනීමේ අපෙක්ෂාව මම නිතරම අගය කළෙමි. එම අරමුණ වෙනුවෙන් එය ළඟාකර ගැනීමේ පරමාර්ථය ඇතිව මම ජීවත්වෙමි. ඉදින් අවශ්‍ය වුවහොත් එම අරමුණ වෙනුවෙන් දිවි පුදන්නට වුව ද මම සූදානමින් සිටිමි."

එම නඩු විභාගයේදී වැරදි කරුවකු කරනු ලැබූ මැන්ඩෙලා ජීවිතාන්තය දක්වා සිරගෙට යවන ලදී. සිර ගෙයි සිටියදීත් මැන්ඩෙලා වර්ණභේදවාදයට විරුද්ධ සටන සඳහා සහයෝගය ලබාගැනීමේ අරගලයෙහි දිගටම නිරතවුණි. ඒ සඳහා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද විශාල සහයෝගයක් ලැබුණ අතර දකුණු අප්‍රිකාව පුරා මහත් අවුල් සහගත තත්වයක් වර්ධනය විය. ඒත් සමගම 1980 ගණන්වලදී පාසැල් සහ කර්මාන්තශාලාවල කටයුතු ද දැඩි ලෙස අවුල් වී ගියේය. ඒ කාලයේ එෆ්. ඩබ්. ද ක්ලාර්ක් දකුණු අප්‍රිකාවේ ජනාධිපති විය. ජනමතය හා බලපෑම් කොතෙක් වැඩි වූයේද යත් 1990 දී මැන්ඩෙලා හිරෙන් නිදහස් කිරීමට වර්ණභේදවාදී රජයට සිදුවිය. ඉන්පසු මැන්ඩෙලා වර්ණභේදවාදය අවසන් කිරීම සඳහා ද ක්ලාර්ක් සමග සාකච්ඡාකොට එකඟතාවකට පැමිණියේය. එම සාකච්ඡා අවසන් වූයේ දකුණු අප්‍රිකාවේ සියලුම ජනයාට ඡන්දබලය ලැබෙන අන්දමේ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් පැවැත්වීමෙනි. 1994 පැවති එම මැතිවරණයෙන් මැන්ඩෙලා ජනාධිපති වශයෙන් තෝරා පත් කරගන්නා ලදී. ඔහු විවිධ ජනයා එක්තැන් කරන පාලම් තැනීමට ප්‍රමුඛත්වය දුන් අතර දකුණු අප්‍රිකාවේ අධ්‍යාපනය හා ආර්ථිකය දියුණු කිරීමටත් සියලු ම ජනතාව අතර සත්‍යය හා සහයෝගිතාව වර්ධනය කිරීමේ පණිවිඩය යැවීමටත් මුල්තැන දී කටයුතු කළේය.

© UCLES 2009

www.xtremepapers.net

දැන් මතු දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1 නෙල්සන් මැන්ඩෙලා ඉපදුණේ කුමන වර්ෂයේද? ඔහුගේ සම්පූර්ණ නම කුමක්ද? [2]

2 මෙම ඡේදයේ වර්ණභේදවාදී ක්‍රමය හඳුන්වා දී ඇති ආකාරය ඔබේ වචනවලින් විස්තර කරන්න. [4]

3 නෙල්සන් මැන්ඩෙලා මහත්මා ගාන්ධී වෙත ඇදී ගියේ මන්ද? [2]

4 ප්‍රසිද්ධ රයිවොනියා නඩු විභාගයේදී මැන්ඩෙලා කළ කථාවේ සඳහන් කළ ඔහුගේ අරමුණු කවරේදැයි ඔබේ වචනවලින් ලියන්න. [3]

5 සිර දඬුවම් විඳිමින් සිටියදී මැන්ඩෙලා කළේ මොනවාද? එහි ප්‍රතිඵල කවරේද? කරුණු තුනක් සඳහන් කරන්න [3]

6 මැන්ඩෙලා එෆ්. ඩබ්. ද ක්ලාර්ක් සමග පැවැත්වූ සාකච්ඡාවේ වැදගත්කම කුමක්ද? [1]

7 දකුණු අප්‍රිකාවේ ජනාධිපති වීමෙන් පසු මැන්ඩෙලා කළේ මොනවාද? [5]

[කරුණුවලට ලකුණු 20 යි, භාෂාවට ලකුණු 5 යි]

**[20 marks for content, 5 marks for language]**

© UCLES 2009


www.xtremepapers.net

**BLANK PAGE**



www.xtremepapers.net

BLANK PAGE



www.xtremepapers.net

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.



www.xtremepapers.net